**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

පදනම් විභාගය - ජනවාරි 2015

## (53) ව්‍යාපාර අධ්‍යයනය

(Business Studies)

---

මෙම ප්‍රශ්න පත්‍රය විෂය නිර්දේශයේ බොහෝ කොටස් ආවරණය වන පරිදි පිළියෙල කර තිබුණි. සමස්ථයක් වශයෙන් සලකා බලන විට මෙම ප්‍රශ්න පත්‍රය සඳහා අයදුම්කරුවන්ගේ සාධන මට්ටම සතුටුදායක තත්ත්වයක පැවතුනි. එහෙත් සුළු අයදුම්කරුවන් පිරිසක් සාර්ථක ලෙස පිළිතුරු සැපයීමට අසමත් වී ඇති බව පැහැදිලි විය. මෙහිදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු වන්නේ සාර්ථකව ලකුණු ලබා ගැනීමට නොහැකි වූ අයදුම්කරුවන් දැනුවත් කිරීමය. එක් එක් ප්‍රශ්නය වෙන් වශයෙන් ගෙන සලකා බැලීමේදී උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ අවධානයට ලක්වූ වැදගත් කරුණු පහත දැක්වේ.

## A - කොටස

### ප්‍රශ්න අංක 01 - ලකුණු 40
**(අනිවාර්ය ප්‍රශ්නයකි.)**

මෙම ප්‍රශ්නය අනු කොටස් 20 කින් යුක්ත බහුවරණ ප්‍රශ්නයකි. එක් කොටසකට ලකුණු 02 බැගින් මුළු ලකුණු ප්‍රමාණය 40 කි.

ව්‍යාපාර අධ්‍යයනය විෂය නිර්දේශය සහ එයට අදාල ප්‍රායෝගික දැනුම බොහෝ දුරට ආවරණය වන පරිදි මෙම ප්‍රශ්නය සකසා තිබුණි. මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් සියලු දෙනාම පාහේ පිළිතුරු සපයා ඇතත් වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමට බොහෝ දෙනෙකුට නොහැකි විය. මෙයට ප්‍රධාන හේතුව වී ඇත්තේ ප්‍රශ්න නිවැරදිව අවබෝධ කර නොගැනීමයි.

අනු අංක (E), (P) සහ (T) යන කොටස් වලට නිවැරදි පිළිතුරු සපයා තිබුණේ ඉතාමත් අඩු අයදුම්කරුවන් පිරිසකි. ඒවා සම්බන්ධයෙන් උත්තර පත්‍ර පරීක්ෂකවරුන් දක්වා ඇති නිරීක්ෂණයන් මෙසේය:

(E) ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිවිකුණුම් අනුපාතය (Reverse Repo Rate) නැවත නම් කර ඇත්තේ කුමන නමකින්ද යන්න පිළිබඳව අයදුම්කරුවන් තුල නිවැරදි අවබෝධයක් නොවිය. එබැවින් අයදුම්කරුවන් බහුතරයක් නිවැරදි පිළිතුර තෝරා ගැනීමට අසමත් වී තිබුණි.

(P) විදේශ විනිමය අනුපාතය ආශ්‍රිත සංකල්ප පිළිබඳ නිවැරදි දැනුමක් සහ අවබෝධයක් නොමැතිකමින් බහුතරයක් අයදුම්කරුවන් විසින් මෙම ප්‍රශ්නයට අදාල නිවැරදි පිළිතුර ලෙස "අධි තක්සේරු වීම" යන්න තෝරා ගැනීමට අපොහොසත් විය.

(T) ශ්‍රී ලංකා මහ බැංකුව වාණිජ බැංකු සමග ප්‍රති විකුණුම් (Reverse Purchase) ගිවිසුම් ඇති කර ගැනීමේ ප්‍රතිවිපාක සම්බන්ධයෙන් අයදුම්කරුවන් තුල ඇති අවබෝධය ඉතා දුර්වල බව දක්නට ලැබුණි.

## B කොටස

**ප්‍රශ්න අංක 02 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

**(a)** අයදුම්කරුවන් බොහෝ දෙනෙකු මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇති නමුත් අදාල නිශ්චිත පිළිතුරු දක්වා ඇත්තේ ඉතා ස්වල්ප දෙනෙකි. පොදුවේ කර්මාන්ත සංවර්ධනය සඳහා රජය විසින් ගෙන ඇති පියවර දක්වා ඇතත් මෑත කාලීනව රජය විසින් සපයා ඇති දිරි දීමනා පිළිබඳව සඳහන් කිරීමට බොහෝ දෙනෙකු අසමත් විය.

**(b)** (i) අවම සහභාගය (Minimum subscription) සම්බන්ධයෙන් අයදුම්කරුවන් තුල ප්‍රමාණවත් දැනුමක් සහ අවබෝධයක් නොමැති බව දී තිබූ පිළිතුරු වලින් පැහැදිලි විය.

(ii) කොටස් ප්‍රාරක්ෂණය (Share underwritings) සම්බන්ධව අයදුම්කරුවන්ගේ දැනුම ඉතාමත් අවම මට්ටමක පැවති අතර දී තිබූ පිළිතුරු සාර්ථක ඒවා නොවිය.

(iii) ප්‍රකාශකළ ප්‍රාග්ධනය (Stated capital) සම්බන්ධයෙන් සපයා තිබූ පිළිතුරු බොහොමයක් සාර්ථක මට්ටමක පැවතුණි.

**(c)** සංස්ථා ප්‍රකාශයේ අඩංගු මූලික කරුණු පිළිබඳ දැනුම හොඳ මට්ටමක පැවතුණි. එහෙත් ඇතැම් අයදුම්කරුවන් සංස්ථා ප්‍රකාශය වෙනුවට සාංගමික ව්‍යවස්ථාවලියේ අඩංගු කරුණු දක්වා තිබුණි.

**ප්‍රශ්න අංක 03 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

**(a)** ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් 5ක් සඳහන් කර අදාල මුළු ලකුණු ප්‍රමාණය ලබා ගැනීමට අයදුම්කරුවන් බහුතරයක් සමත් විය.

**(b)** (i) චෙක්පත් වල රේඛනය ඇතුලත් කළ හැකි පාර්ශව පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම ඉතාමත් ඉහළ මට්ටමක පැවතුණි.

(ii) චෙක්පතක රේඛනය අවලංගු කළ හැකි පාර්ශවයන් පිළිබඳ බොහෝ දෙනෙකු තුල ඇති දැනුම නිරවුල් නොවිය. රේඛනය අවලංගු කළ හැකි පාර්ශවයන් නම් කිරීමේදී ඔවුන්ගේ දුර්වලතාවයන් දක්නට ලැබුණි.

**(c)** (i) ලියාපදිංචි කළ මූල්‍ය ආයතනයක් යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න නිවැරදිව සඳහන් කිරීමට සමත් වූයේ ඉතා සුළු අයදුම්කරුවන් පිරිසක් පමණි.

(ii) ලියාපදිංචි නොකළ මූල්‍ය ව්‍යාපාරයකට වඩා ලියාපදිංචි කළ මූල්‍ය සමාගමක් සමඟ ගනුදෙනු කිරීමේ දී, ගනුදෙනුකරුවෙකුට ලැබෙන වාසි නිවැරදිව පැහැදිලි කිරීමට ද බොහෝ අයදුම්කරුවන් අසමත් විය.

**ප්‍රශ්න අංක 04 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය (Sri Lanka Chamber of Commerce) පිළිබඳ නිවැරදි අවබෝධයක් නොමැති අයදුම්කරුවන් බොහෝ ප්‍රමාණයක් සිටි අතර එම ආයතනයෙන් එහි සාමාජිකයන්ට ලබාදෙන වාසි නිවැරදිව දැක්වීමට ඔවුන්ට නොහැකි විය.

(b) ශ්‍රී ලංකාවේ ආයෝජන ප්‍රවර්ධන කලාපය (processing zone) තුළ හෝ කර්මාන්ත උද්‍යානයක් (industrial park) තුළ ව්‍යාපෘතියක් ආරම්භ කරන ආයෝජකයෙකුට සැලසෙන දිරි දීමනා මොනවාද යන්න පිළිබඳව අයදුම්කරුවන්ගේ අවබෝධය ඉතා දුර්වල මට්ටමක පැවතුනි. මෙයට නිවැරදි පිළිතුරු සපයා තිබුණේ ඉතාමත් ස්වල්ප දෙනෙකු පමණක් වන අතර එසේ පිළිතුරු සැපයුවන්ද ලබාගෙන ඇත්තේ ඉතාමත් අඩු ලකුණු ප්‍රමාණයකි.

(c) අපනයන ණය රක්ෂණ ඔප්පු (Export Credit Insurance Policies) තුළින් ලබා ගත හැකි වාසි පිළිබඳව අසා තිබූ මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් සැහෙන පිරිසක් ඉතාමත් සාර්ථක ලෙස පිළිතුරු සපයා තිබුණි.

**ප්‍රශ්න අංක 05 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) (i) ද්විත්ව රක්ෂණය (Dual insurance) යන්න පැහිදිලි කිරිමේදී බොහෝ අයදුම්කරුවන් ප්‍රමාණයක් නිවැරදිව පිළිතුරු සපයා තිබුණි. එහෙත් අතලොස්සක් අයදුම්කරුවන් විසින් "දේපල හා ජීවිතය" යන දෙකම එකවර රක්ෂණය කිරීම "ද්විත්ව රක්ෂණය" ලෙස අනවබෝධයෙන් දක්වා තිබුණි.

(ii) ප්‍රති-රක්ෂණය (Re-insurance) යන්න පැහැදිලි කිරීමේදී නිවැරදි පිළිතුරු ලබා දී තිබුණේ ඉතා ස්වල්ප දෙනෙකි. දී තිබූ පිළිතුරු බොහොමයක නිරවුල් බවක් දක්නට නොවීය. සමහර අයදුම්කරුවන් ප්‍රතිරක්ෂණය යනු රක්ෂණය අවසන් වූ පසු නැවත රක්ෂණය කිරීම ලෙස වැරදියට දක්වා තිබුණි.

(b) දේපල රක්ෂණය සහ ජීවිත රක්ෂණය අතර ඇති වෙනස්කම් 3ක් දක්වන මෙන් අසා තිබූ මෙම ප්‍රශ්නයට බහුතරයක් අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු සපයා සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට සමත් වූහ.

(c) රක්ෂණය තුළින් ව්‍යාපාරිකයෙකුට සැලසෙන වාසි ලැයිස්තුගත කරන ලෙස දක්වා තිබූ මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් බහුතරයක් නිවැරදි පිළිතුරු සපයා තිබූ අතර සමහරුන් ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කර නොගෙන ජීවිත රක්ෂණයෙන් ව්‍යාපාරයට සැලසෙන වාසි පිළිතුරු ලෙස දක්වා තිබුණි.

**ප්‍රශ්න අංක 06 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) අන්තර්ජාතික වෙළෙඳාම සම්බන්ධයෙන් නෞභාරපතක වැදගත්කම පැහැදිලි කරන ලෙස දක්වා තිබූ මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් බොහෝ දෙනෙකු නිවැරදිව පිළිතුරු සපයා තිබූ නමුත් නිරවුල්ව පිළිතුරු සපයා තිබුණේ ඉතාම සුළු පිරිසකි. ඇතැමුන් නෞභාරපතක වැදගත්කම වෙනුවට ලක්ෂණ දක්වා තිබුණි.

(b) ගෙවුම් ශේෂ ගිණුමට පිළියම් 5ක් සඳහන් කරන ලෙස දක්වා තිබූ මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් සැහෙන පිරිසක් පිළිතුරු සපයා තිබූ අතර ඔවුන් අතුරින් මුළු ලකුණු ප්‍රමාණයම ලබා තිබුණේ ඉතාමත් සුළු අයදුම්කරුවන් පිරිසකි.

(c) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (International Monetary Fund - IMF) අරමුණු 5 ක් සඳහන් කරන ලෙස දක්වා තිබූ මෙම ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා තිබුණේ ඉතා සුළු අයදුම්කරුවන් පිරිසක් වන අතර ඔවුන්ගේද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සම්බන්ධව ඇති දැනුම ඉතා පහළ මට්ටමක පැවතුණි.

**ප්‍රශ්න අංක 07 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

පහත දැක්වෙන කරුණු පිළිබඳ කෙටි සටහන් ලියන ලෙස දක්වා තිබූ මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබුණේ ඉතාමත් ස්වල්ප දෙනෙකු පමණි.

(a) <u>ප්‍රධාන පුවරුව (Main Board)</u> :

මෙයට පිළිතුරු සැපයූ බොහෝ දෙනෙකුට ප්‍රධාන පුවරුව පිළිබඳව නිවැරදි අවබෝධයක් නොවීය. ඇතැම් අයදුම්කරුවන් විසින් සමාගමක් ප්‍රථම වරට කොටස් නිකුත් කරන විට එම කොටස් ලියාපදිංචි කරන්නේ ප්‍රධාන පුවරුවේ යනුවෙන් වැරදි ලෙස දක්වා තිබුණි.

(b) <u>දූෂ්‍ය නෞභාරපත (Dirty Bill of Lading)</u>

මෙම කරුණ පැහැදිලි කිරීම සඳහා ඉදිරිපත්ව තිබුණේ අයදුම්කරුවන්ගෙන් ඉතා ස්වල්ප දෙනෙක් පමණි. ඔවුන් අතුරින් නැව්ගත කිරීම සඳහා බාර දුන් භාණ්ඩ කැඩී බිඳී ඇති බව නෞභාර පතේ සඳහන් කර ඇති විට එය දූෂ්‍ය නෞභාර පත ලෙස හඳුන්වනු ලබන බව නිවැරදිව සඳහන් කර තිබුණේ ඉතා සුළු අයදුම්කරුවන් පිරිසකි.

(c) <u>ආරූඪ හවුල්කරු (Quasi Partner)</u>

අයදුම්කරුවන් බහුතරයක් මෙම කොටස සඳහා නිවැරදිව පිළිතුරු සපයා තිබුණි.

(d) <u>මූර්ත විනිමය අනුපාතය (Real Exchange Rate)</u>

මෙයට දී ඇති පිළිතුරු වලින් මේ පිළිබඳව අයදුම්කරුවන්ගේ අනවබෝධය මනාව පැහැදිලි විය.

(e) <u>විනිමය අනුපාතය අවතක්සේරු වීම (Undervaluation of Exchange Rate)</u>

බොහෝ අයදුම්කරුවන් ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කර නොගැනීම නිසා දී තිබූ පිළිතුරු නිවැරදි ඒවා නොවීය. ඇතැම් අයදුම්කරුවන් විනිමය අනුපාතය අවතක්සේරු වීම, අවප්‍රමාණය වීම ලෙසද දක්වා තිබුණි.

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීම සඳහා</u>**

**<u>සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

1. ප්‍රශ්න පත්‍රය ලබා ගත් වහාම ආරම්භයේ දී ඇති **"අයදුම්කරුවන්ට උපදෙස්"** හොඳින් සැලකිලිමත්ව කියවා අනිවාර්ය ප්‍රශ්න සහ තෝරා ගතහැකි ප්‍රශ්න මොනවාද යන්න පිළිබඳව අවබෝධ කර ගත යුතුය. ප්‍රශ්න පත්‍රයේම උත්තර ලියා අමුණා තැබීම නොකළ යුතුයි.
2. ප්‍රශ්නය කීපවරක් හොඳින් කියවා මැනැවින් අවබෝධ කර ගෙන අසා ඇති කරුණු වලට පමණක් පිළිතුරු සැපයිය යුතුය. අදාල නොවන කරුණු ඇතුලත් නොකළ යුතුය.
3. පිළිතුරු සැපයීමේදී කාලය බෙදාගැනීම පිළිබඳව සැලකිලිමත් විය යුතුය.
4. උත්තර පත්‍ර භාර දීමට පෙර විභාග ශාලාවේදී ප්‍රශ්න අංක හා තමන්ගේ විභාග අංකය නිසිපරිදි යොදා ඇත්දැයි පරීක්ෂා කර බැලීම.
5. අත්අකුරු පැහැදිලිව ලිවීම මගින් පරීක්ෂකවරයාට උත්තර පත්‍රය කියවා හොඳින් අවබෝධ කරගැනීමට සැලැස්වීමෙන් උපරිම ලකුණු ප්‍රමාණය ලබා ගැනීමට හැකිවනු ඇත.
6. පසුගිය වසරවල විභාග ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමෙන් විෂය දැනුම වර්ධනය කර ගැනීමටත්, වේගවත්ව පිළිතුරු සැපයීමේ නිපුණතාව ඇතිකර ගැනීමටත් හැකියාව ලැබේ.
7. දැනුම යාවත්කාලීන කර ගැනීම සඳහා අළුතින් නිකුත් කරන සඟරා, පුවත්පත්, අත්පොත්, පාඨ ග්‍රන්ථ නිරන්තරයෙන් අධ්‍යයනය කළ යුතු වේ.
8. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

\- * * * -